සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

දෙවන වාර විභාගය - 2018
Second Term Evaluation

| ශ්‍රේණිය / தரம் / Grade | 10 | විෂයය / பாடம் / Subject | Christianity | පත්‍රය / வினாத்தாள் / Paper | II | පැය / மணித்தியாலம் / Hours | 02 |
|---|---|---|---|---|---|---|---|

පළමුවන අනිවාර්ය ප්‍රශ්නය හා තෝරාගත් තවත් ප්‍රශ්න හතරක් ඇතුළුව සියලුම ප්‍රශ්න 5කට පිළිතුරු සපයන්න

1. 1) ජුදෙව් නමස්කාරයේ කේන්ද්‍රස්ථානය නම් කරන්න.
   2) "ප්‍රේරිත" යන්නෙහි අර්ථය ලියන්න.
   3) ජේසුස් වහන්සේ ශ්‍රාවකයන් සැත්තා දෙනාට දුන් උපදෙස් 2 ක් ලියන්න.
   4) ජේසුස් වහන්සේ සබත් දින සුව කළ රෝගීන් දෙදෙනෙකු නම් කරන්න.
   5) ජුදෙව් ජනතාවට ගෙවීමට සිදුවූ බදු වර්ග 2 නම් කරන්න.
   6) එකම රොටිය කඩා අනුභව කිරීමෙන් හා එකම කුසලාන පානය කිරීමෙන් සංකේතාත්මකව ගම්‍ය වන කිතුනු ගුණාංග 2 ක් නම් කරන්න.
   7) දේව රාජ්‍ය වර්ධනය පිළිබඳව ඉගැන්වීමට ජේසුස් වහන්සේ යොදාගත් උපමා කථා 2 ක් නම් කරන්න.
   8) ජේසුස් වහන්සේ ස්වභාව ධර්මය අභිබවා ක්‍රියා කළ ප්‍රාතිහාර්‍ය 2 ක් නම් කරන්න.
   9) ජේසුස් වහන්සේගේ රූප විපර්යාස අවස්ථාවේ උන්වහන්සේ දෙපස සිටි අය නම් කරන්න.
   10) කිතුනු දරුවකු තුළ තිබිය යුතු යහපත් ගුණාංග 2 ක් ලියන්න.

(ල. 2X10=20)

2. 1) සද්දුසිවරුන්ට පමණක් විශේෂිත වූ ලක්ෂණ 2 ක් ලියන්න. (ල-2)
   2) සද්දුසිවරු ජේසුස්ස වහන්සේට ඉදිරිපත් කළ ගැටලු 3 ක් ලියන්න. (ල-3)
   3) අපගේ ඇදහිල්ල දුබල විය හැකි අවස්ථා 2 ක් නම් කොට ඊට විසඳුම් සෙවිය යුතු ආකාරය පිළිබඳ කරුණු ඉදිරිපත් කරන්න. (ල-5)

3. 1) ස්නාවක ජොහාන්තුමාගේ මෙහෙවරෙහි මූලික පරමාර්ථය වූයේ කුමක්ද? (ල-2)
   2) ස්නාවක ජොහන්තුමා පණිවුඩය ලබා දුන් ජන කණ්ඩායම් 3 ක් නම් කරන්න (ල-3)
   3) අප සමාජයේ මිනිසුන් පීඩාවට පත්වන ආකාර 2 ක් නම් කොට ඔවුන් වෙනුවෙන් ඔබට කළ හැකි මෙහෙවර ලියන්න. (ල-5)

4. 1) ජේසුස් වහන්සේ කුරුසිපත් කිරීමට පෙර විනිශ්චය සඳහා රැගෙන ගිය ස්ථාන හා පුද්ගලයන් නම් කරන්න. (ල-2)
   2) ජේසුස්වහන්සේ කුරුසිපත් කිරීම සඳහා එල්ල වූ චෝදනා 3 ක් ලියන්න. (ල-3)
   3) ස්වාමීන්ගේ යාච්ඤාව තුළ ඇති "කමාව" පිළිබඳව සඳහන් වන වදන් ලියා, එය ඔබගේ ජීවිතයෙන් ක්‍රියාත්මක කරන ආකාරය ලියා දක්වන්න (ල-5)

5. 1) පේදුරුගේ මහ ප්‍රකාශනය ලියන්න. (ල-2)

2) ජේසුස් වහන්සේගේ දුක් ප්‍රාප්තියට සම්බන්ධ වෙමින් කටයුතු කළ තිදෙනෙකු නම් කරන්න.(ල-3)

3) "පරික්ෂාවට නොවැටෙන පිණිස යාච්ඤා කරන්න" මෙම වදන් අනුව ඔබ පරීක්ෂාවට ලක්වන අවස්ථා 2 ක් නම් කොට ඊට ගත යුතු ක්‍රියාමාර්ග ලියා දක්වන්න. (ල-5)

6. 1) ජේසුස් වහන්සේට පැමිණි පරීක්ෂා 3 ලියන්න. (ල-2)

2) ජේසුස් වහන්සේ එම පරීක්ෂාවන්ට පිළිතුරු දීම සඳහා යොදාගත් දෙව් වදන් ලියා දක්වන්න(ල-3)

3) "ධනය, බලය, කීර්තිය පසුපස යන ලොව තුළ කිතුනු දරුවකු ලෙස ක්‍රියා කරමු" යන මැයෙන් සඟරාවකට ඉදිරිපත් කිරීමට ලිපියක් සකසන්න. (ල-5)

7. පහත මාතෘකා අතරින් 2 ක් තෝරා කෙටි සටහන් ලියන්න.

අ) දේව රාජ්‍ය වර්ධනයට දායක වෙමු.

ආ) කිතුනු බෞතීස්මය

ඇ) අප අදහන ජේසුස් වහන්සේ ජීවමානය

ඈ) ස්නාවක ජොහන්තුමාගේ සේවය. (ල.5X2=10)

සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

දෙවන වාර විභාගය - 2018
Second Term Evaluation

| ශ්‍රේණිය / தரம் / Grade | 10 | විෂයය / பாடம் / Subject | Christianity | පත්‍රය / வினாத்தாள் / Paper | I | පැය / மணித்தியாலம் / Hours | 01 |
|---|---|---|---|---|---|---|---|

1 - 40 දක්වා දී ඇති ප්‍රශ්නවලට වඩාත් නිවැරදි පිළිතුර තෝරන්න.

1. " දෙවියන් වහන්සේ අප සමඟය" යන අර්ථය ඇති නාමය වන්නේ,
   1. ක්‍රිස්ටොස් 2. එම්මානුවෙල් 3. බිබ්ලියොන් 4. ලෝගෝස්

2. සේවය ලැබීම නොව සේවය කිරීමට යොමුවිය යුතු බව ආදර්ශය අප වෙත ගෙන ආවේ,
   1. ස්නාවක ජොහාන්තුමා 3. ජේසුස් වහන්සේ
   2. පාවුල්තුමා 4. පේදුරුතුමා

3. ජේසුස් වහන්සේ දුක් උසුලන සේවකයා වශයෙන් හඳුන්වන්නේ,
   1. ජෙරමියා දිවැසිවරයා 3. මීකා දිවැසිවරයා
   2. එසකියෙල් දිවැසිවරයා 4. යෙසායා දිවැසිවරයා

4. ස්නාවක ජොහාන්ගේ මව හා පියා වන්නේ
   1. සෙකරියස් හා එලිසබෙත්
   2. ආබ්‍රහම් හා සාරායි
   3. ඊසාක් හා රෙබෙකා
   4. ජාකොබ් හා රාකෙල්

5. " දෙවියන් වහන්සේ මුදන සේක" යන අර්ථය ඇති නාමය හිමිවූයේ
   1. ස්නාවක ජොහාන්ට 3. ජේසුස් වහන්සේට
   2. ජෙරමියා දිවැසිවරයාට 4. දාවිත් රජතුමාට

6. පුද්ගලික සිත් හැරීම හා පරාර්ථකාමීව ක්‍රියා කිරීමට යොමුකරවමින් තම දූත මෙහෙවර ඉටුකළේ,
   1. පාවුල්තුමා 3. ජාකොබ් තුමා
   2. ස්නාවක ජොහාන්තුමා 4. පේදුරුතුමා

7. දාවිත් රජු තමන්ට ද සිය පිරිවරට ද බඩගිනි වූ විට කළ දේ සිහිපත් කරමින් ජේසුස් වහන්සේ කරුණු පැහැදිලි කළේ,
   1. සබත කඩ කිරීමේ ප්‍රශ්නය අවස්ථාවේදී
   2. කුරුසි පත් කිරීමට තීන්දු වූ අවස්ථාවේ
   3. පන්දහසකට කෑම ලබා දුන් අවස්ථාවේ
   4. දාවිත් රජු පිළිබඳ කථාකළ අවස්ථාවේ

8. "ඔබ පිඟානේද කෝප්පයේද පිට පැත්ත පිරිසිදු කරන්නාහුය" යනුවෙන් ජේසුස් වහන්සේ චෝදනා කළේ,
   1. නායක පූජකයන්ට 3. සාමාන්‍ය ජනතාවට
   2. කාන්තාවන්ට 4. පරිසිවරු හා විනයධරයන්ට

9. දෙවියන් වහන්සේ විසින් ඊශ්‍රායෙල් ජනතාව මිසරයේ වහල් බවින් මුදවා ගනු ලැබීම සිහිපත් කරන මංගල්‍යය වන්නේ,
   1. පාස්කු මංගල්‍යය 3. සති මංගල්‍යය
   2. කූඩාරම් මංගල්‍යය 4. අස්වැන්න මංගල්‍යය

10. අපගේ දේව ගෘහයන් කෙලෙස පවත්වාගත යුතු දැයි පූර්වාදර්ශයක් ලබා දුන් සිද්ධිය වන්නේ,
   1. ජේසු වහන්සේ පාස්කු මංගල්‍යයට යාම.
   2. ජේසුස්වහන්සේ ජේරුසලම් දේව මාලිගාව පවිත්‍ර කිරීම.
   3. ජේසුස්වහන්සේ පළමු දේශනය පැවැත්වීම.
   4. ජේසුස් වහන්සේ රෝගීන් සුව කිරීම.

11. දේව රාජ්‍යයේ පදනම සාමය බව සංකේතාත්මකව පෙන්වීමට ජේසුස්වහන්සේ ක්‍රියා කළේ,
   1. අශ්වයකු පිට ගමන් කිරීම
   2. ගවයකු පිට ගමන් කිරීම
   3. කොටලුවකු පිට ගමන් කිරීම
   4. අලියකු පිට ගමන් කිරීම

12. ජේසුස් වහන්සේ සිඹීමකින් පාවාදුන් ශ්‍රාවකයා වන්නේ,
   1. ජුදස්
   2. තෝමස්
   3. ජොහාන්
   4. ජාකොබ්

13. "මාගේ කැමැත්ත නොව ඔබගේ කැමැත්ත වේවායි." ජේසුස් වහන්සේගේ යාච්ඤාව විය. මින් කිතුනු අපට ලබා දෙන ආදර්ශය
   1. සැමගේ කැමැත්ත ඉටුකළ යුතු බව.
   2. අපගේ කැමැත්තට ක්‍රියාකළ යුතු බව.
   3. අන් අයගේ සතුටට ඕනෑම ක්‍රියාවක් කළ යුතු බව.
   4. තමකම සම්පූර්ණයෙන් නසා දැමිය යුතු බව.

14. ජේසුස්වහන්සේගේ අන්තිම රාත්‍රි භෝජනයෙන් අනතුරුව උන්වහන්සේ යාච්ඤා කිරීම පිණිස ගමන් කළේ,
   1. සීනාය කන්දට
   2. කල්වරි කන්දට
   3. ඔලිව කන්දට
   4. හෙබ්‍රොන් කන්දට

15. ජේසුස්වහන්සේ කුරුසිපත් වු මොහොතේ සිදුවූ විශේෂ සිදුවීම් අතර දේව මාලිගාවේ තිරය දෙකඩ වීමෙන් පෙන්නුම් කරන්නේ,
   1. දෙවි සමිඳුන් දේව මාලිගයේ සිටින බවය.
   2. දෙවි සමිඳුන් වෙතට යාමට තිබූ බාධකය ඉවත් වු බවය.
   3. දෙවි සමිඳුන් ලොව පහළ වු බවය.
   4. දෙවි සමිඳුන් වෙතට යාමට තවත් බාධාවත් ඇති වු බවය.

16. ජේසුස් වහන්සේ කුරුසිපත් මොහොතේ අපහාසාත්මකව හා පරීක්ෂාවට ලක් කරමින් ඔබ ජුදෙව්වන්ගෙන් රජු නම් ඔබම ගලවා ගනින්න යැයි පැවසුවේ,
   1. මුර සෙබලුන්
   2. කාන්තාවන්
   3. පූජකවරු
   4. සාමාන්‍ය ජනතාව

17. ජේසුස් වහන්සේ කුරුසිපත් කළේ,
   1. සීනයි කන්දේදී
   3. කපාල පිටිය නම් ස්ථානයේදී
   3. මළ මුහුද අසල
   4. තාබෝර් කන්දේදී

18. ජේසුස් වහන්සේ සමග මරණයට වුවද සුදානම් යයි කී නමුත් උන්වහන්සේ නාඳුනන බව කී ශ්‍රාවකයා,
   1. ජෝසෙප්
   2. මත්තියස්
   3. ජාකොබ්
   4. සිමොන් පේදුරු

19. ජේසුස් වහන්සේ නාඳුනන බව කී ප්‍රකාශය හඳුන්වන්නේ
   1. පේදුරුගේ අපලාපය
   2. පේදුරුගේ විලාපය
   3. ජාකොබ්ගේ අපලාපය
   4. ජාකොබ්ගේ විලාපය

20. එම්මාවුස් ගමට යමින් සිටියදී ජේසුස් වහන්සේ පුනරුජ්ජීවනය වු බව අත්දුටු කරගත් ශ්‍රාවකයා වන්නේ,
1. බර්තොලමෙවුස් 3. ක්ලේයෝපස්
2. ජාකොබ් 4. තෝමස්

21. ජේසුස් වහන්සේගේ පුනරුජ්ජීවනය පිළිබඳව විමසා බලා තහවුරු කරගත් ශ්‍රාවකයා වන්නේ,
1. පේදුරු 3. ජොහාන්
2. ජාකොබ් 4. ඇන්ඩෘ

22. "ජීවමාන තැනැන්වහහන්සේ මළවුන් අතර සොයන්නේ මන්ද?" මෙම ප්‍රකාශය තුළින් අපට වටහා ගත හැකි සත්‍යතාව වන්නේ,
1. ජේසුස් වහන්සේ ජීවමාන බව 3. ජේසුස් වහන්සේ නොපෙනී ගිය බව
2. ජේසුස් වහන්සේ ස්වර්ගස්ථ වු බව 4. ජේසුස් වහන්සේ දෙවිඳුන් ළඟ බව

23. ජේසුස් වහන්සේගේ නැවත නැගීටීම පිළිබඳ මුල්ම දේවදුත පණිවුඩය ලැබුයේ,
1. සොහොන වෙත ගිය කාන්තාවන්
2. සොහොන වෙත ගිය ශ්‍රාවකයින්
3. සොහොන වෙත ගිය පුජකයන්
4. සොහොන වෙත ගිය මුර සෙබලුන්

24. ජේසුස් වහන්සේ කුරුසියේ කරන ලද ජීවිත පුජාව තුළින් අපට හිමිවන වරප්‍රසාදය වන්නේ,
1. පාපය හඳුනාගත හැකිව ඇත.
2. පාපයට ගැතිව ජීවත් විය හැකිය.
3. පාපයට කමාව හිමිව ඇත.
4. පාපයට යොමුවීමට අවස්ථාව ඇත.

25. ජේසුස් වහන්සේගේ බෞතීස්මය අවස්ථාවේ සිදුවු විශේෂ සිදුවීමක් වන්නේ,
1. පරවියකු පහළ වීම
2. ශුද්ධාත්මයාණන් වහන්සේ ගිනි සලු ලෙසින් පහළ වීම
3. ගිනි සිලු පහළ වීම
4. ශුද්ධාත්මයාණන් වහන්සේ පරවියකු ස්වරූපයෙන් පහළ වීම

26. ස්නාවක ජොහාන්තුමා තම බෞතීස්මය ලබා දෙමින් ජනතාව කැඳවුයේ
1. පාපයෙන් නිදහස ලැබීමට
2. පසුතැවිල්ලේ බෞතීස්මයට
3. පාපයට එරෙහි වීමට
4. ගැලවීමේ බෞතීස්මයට

27. ජේසුස් වහන්සේට පැමිණි පරීක්ෂා අතර ජනතාවගේ ශාරීරික පෝෂණය සඳහා පමණක් දේව බලය යොදා ගැනීමට යොමුවීම කෙරෙහි පැමිණි පරීක්ෂාව වන්නේ,
1. සාතන්ට නමස්කාර කිරීම 3. දේව මාලිගය මුදුනින් පැනීම
2. ගල් පාන් කිරීම 4. මේ සියල්ලම

28. ජේසුස් වහන්සේ ජෝර්දාන් ගංගාවෙහි බෞතීස්මයෙන් පසු ශුද්ධාත්මයෙන් පුර්ණව ගමන් කළේ,
1. දේව මාලිගයට 3. පාළුකරයට
3. සිනගෝගයට 4. තම නිවසට

29. වලා පටලය ශුද්ධ බයිබලයේ නිතර සංකේතවත් කරන්නේ,
1. දේව ස්වරූපය 3. දේව බලය
4. දේව අභිමුඛත්වය 4. දේව මහිමය

30. ජේසුස්වහන්සේගේ උත්ථානය හා ස්වර්ගරෝහනයෙන් පසු ශ්‍රාවකයින්ගේ සාක්ෂි දැරීමේ පදනම වුයේ,

1. බෞතීස්මය
2. පළමු දේශණය
3. රෝග සුවකිරීම
4. රූප විපර්යාසය

31. ජේසුස් වහන්සේගේ රූප විපර්යාසය අවස්ථාවේ උන්වහන්සේ දෙපස දර්ශණය වුයේ,

1. මෝසෙස් හා එලියා
2. මෝසෙස් හා එලීෂා
3. එලියා හා ජෙරමියා
4. එලියා හා එසකියෙල්

32. රූප විපර්යාසය අවස්ථාවේ ජේසුස්වහන්සේගේ දෙපස දර්ශණය වු දෙදෙනා සමග සාකච්ඡාවට භාජනය වන්නට ඇත්තේ,

1. උන්වහන්සේ මහිමයට පත්වන ආකාරය පිළිබඳව
2. උන්වහන්සේගේ බෞතීස්මය පිළිබඳව
3. උන්වහන්සේගේ කුරුසි පුජාව පිළිබඳව
4. උන්වහන්සේගේ බලය පිළිබඳව

33. මුළු ඊශ්‍රායෙල් ජනතාව අතර මෙතරම් ශ්‍රාද්ධාවක් දැක නැතැයි ජේසුස් වහන්සේ පැවසුයේ,

1. කපර්නවුමෙහි රෝම ශතාධිපතියා පිළිබඳව
2. කපර්නවුමෙහි රජු පිළිබඳව
3. පිලාත් පිළිබඳව
4. හෙරෝද් පිළිබඳව

34. දේව බලය තුළ යක්ෂයාගේ බලය ව්‍යර්ථවූ අවස්ථාවකි,

1. පන්දහසකට කෑම දීම
2. ගෙරසේනයන්ගේ රටේ අශුද්ධාත්මය සුවකිරීම
3. නායින් නුවර වැන්දඹුවගේ පුතා සුව කිරීම
4. මතෙව් නොහොත් ලෙවි කැඳවීම

35. ජේසුස් වහන්සේ සිදුකළ ප්‍රාතිහාර්ය තුළින් අවබෝධ කරගත හැකි කරුණක් වන්නේ,

1. ස්වභාවධර්මය පවා ජේසුස්වහන්සේගේ අධිපත්‍යයට යටත් බව.
2. ස්වභාවධර්මය පවා වෙනස්වීමට අවනත නොවන බව
3. ජේසුස් වහන්සේ තම බලය රජවරු ඉදිරියේ විදහා පෑ බව
4. ජේසුස් වහන්සේගේ බලය පරිසිවරු ඉදිරියේ පෙන්වූ බව

36. " දැරිය නැගිටින්න" යනුවෙන් ජේසුස් වහන්සේ ප්‍රකාශ කළේ,

1. මී මැස්මොර දරුවාට
2. පේදුරුගේ නැන්දනියට
3. ජයිරස්ගේ දියණිය
4. ආශිර්වාද ලැබීමට පැමිණි දැරියකට

37. දේව රාජ්‍යතුළ ආධිපත්‍ය හා බලය හිමිවන්නේ

1. මිනිසාට
2. දෙවියන්වහන්සේට
3. රජවරුන්ට
4. රබ්බිවරුන්ට

38. දේව රාජ්‍ය වර්ධනය අත්දකින කිතුනුවා

1. යාච්ඤාවෙන් හා බලයෙන් යුතුව ක්‍රියා කරයි
2. ඇදහිල්ලෙන් හා ආත්මාර්කාමීව ක්‍රියා කරයි
3. බලයෙන් හා පරාර්ථකාමීව ක්‍රියා කරයි
4. යාච්ඤාවෙන් හා ඇදහිල්ලෙන් ක්‍රියා කරයි

39. කිතුනු දරුවකු ලෙස කටයුතු කරන ඔබ වඩාත් උද්යෝගිමත්ව කළ යුතු ක්‍රියාවන් නම්,

1. ශුද්ධ බයිබලය දිනපතා කියවීම
2. රාත්‍රියේ පමණක් යාච්ඤා කිරීම
3. එකිනෙකාට උපකාර කිරීමට නායකත්වය ගැනීම
4. දේව වචනය පිළිබඳ පෝස්ටර් නිර්මාණය

40. කිතුනු දරුවකු ලෙස වඩාත් සුදුසු ක්‍රියාපටිපාටිය නම්,

1. වගකීමෙන් ක්‍රියාකළ යුතු වේ.
2. එකමුතුකමින් ක්‍රියාකළ යුතු වේ.
3. වැයවීමෙන් ක්‍රියාකළ යුතුවේ
4. දයාවෙන් ක්‍රියාකළ යුතුවේ.